වයාපාර කලමණාකරණය

AAT දෙවැනි අදියර

කළමනාකරණය යනු කුමක්ද?

කළමනාකරණය යනු සංවිධානයක අරමුණු කාර්යක්ෂමව **(Efficiently)** සහ සඵලදායීව **(Effectively)** ළඟා කර ගැනීම සඳහා එම සංවිධානයේ සම්පත් (මානව, මූල්‍ය, භෞතික සහ තොරතුරු) නිසි ලෙස සැලසුම් කිරීම, සංවිධානය කිරීම, මෙහෙයවීම සහ පාලනය කිරීමේ ක්‍රියාවලියයි.

- **කාර්යක්ෂමතාව (Efficiency):** අවම පිරිවැයකින් සහ අවම සම්පත් නාස්තියකින් උපරිම නිමවුමක් ලබා ගැනීමයි. පීටර් ඩ්‍රකර්ට අනුව මෙය "නිවැරදි අයුරින් යමක් ඉටු කිරීමයි".
- **සඵලදායීත්වය (Effectiveness):** ආයතනය විසින් සැලසුම් කරගත් ප්‍රතිඵල හෝ අරමුණු එලෙසම ඉටු කර ගැනීමයි. මෙය "නිවැරදි දේ ඉටු කිරීම" ලෙසද හැඳින්වේ.

PassWay.lk
aat SRI LANKA

කළමනාකරණයේ ස්වභාවය

- **අරමුණු පාදක වේ:** සැමවිටම සංවිධානයේ මූලික පරමාර්ථ ළඟා කර ගැනීම දෙසට යොමු වේ.
- **අඛණ්ඩ ක්‍රියාවලියකි:** මෙය එක් වරක් කර අවසන් කරන්නක් නොව, දිගින් දිගටම සිදුවන්නකි.
- **ගතික ක්‍රියාවලියකි:** කාලයට සහ පරිසරයට අනුව වෙනස් වන ස්වභාවයක් ගනී.
- **කලාවක් සහ විද්‍යාවකි:** කළමනාකරණය සඳහා නිර්මාණශීලීත්වය සහ කුසලතා අවශ්‍ය වන බැවින් එය කලාවකි; එමෙන්ම එය ක්‍රමවේද සහ මූලධර්ම මත පදනම් වන බැවින් විද්‍යාවකි.

PassWay.lk

aat SRI LANKA

ආයතනික සම්පත් සහ වත්කම්

ආයතනයක භාණ්ඩ හා සේවා නිෂ්පාදනයට යොදා ගන්නා යෙදවුම් **සම්පත්** ලෙස හැඳින්වේ. මේවා ප්‍රධාන වශයෙන් **7Ms** ලෙස හඳුනාගත හැක

- මිනිසුන් (Men)
- මුදල් (Money)
- යන්ත්‍ර (Machines)
- අමුද්‍රව්‍ය (Materials)
- ක්‍රමවිධි (Methods)
- කාලය (Minutes)
- වෙළෙඳපොළ (Market)

PassWay.lk

aat SRI LANKA

කළමනාකරණ ක්‍රියාවලියේ ප්‍රධාන කාර්යයන්

- **සැලසුම්කරණය (Planning):** අරමුණු තීරණය කිරීම සහ ඒවා ඉටු කරගන්නා ආකාරය තීරණය කිරීම.
- **සංවිධානකරණය (Organizing):** කාර්යයන් ඉටු කිරීම සඳහා වගකීම් පැවරීම සහ අවශ්‍ය සම්පත් බෙදා දීම.
- **මෙහෙයවීම (Leading):** සේවකයින් අභිප්‍රේරණය කිරීම, මඟ පෙන්වීම සහ ඔවුන්ගේ උත්සාහයන් අරමුණු දෙසට යොමු කිරීම.
- **පාලනය (Controlling):** අපේක්ෂිත ප්‍රතිඵල සහ සත්‍ය ප්‍රතිඵල සන්සන්දනය කර අවශ්‍ය නිවැරදි කිරීම් සිදු කිරීම

කළමනාකරණ මට්ටම් (ධූරාවලිය)

- **ඉහළ මට්ටම:** සමස්ත ආයතනයේ අරමුණු, උපායමාර්ග සහ ප්‍රතිපත්ති තීරණය කරයි (උදා: සභාපති, CEO).
- **මධ්‍යම මට්ටම:** ඉහළ මට්ටමේ ප්‍රතිපත්ති ක්‍රියාවට නංවයි. දෙපාර්තමේන්තු ප්‍රධානීන් ලෙස කටයුතු කරයි (උදා: අලෙවි කළමනාකරු).
- **පහළ මට්ටම (පෙරමුණේ කළමනාකරුවන්):** දෛනික මෙහෙයුම් කටයුතු අධීක්ෂණය කරයි (උදා: සුපරීක්ෂක, කණ්ඩායම් නායක).

PassWay.lk
aat SRI LANKA

කළමනාකරණ භූමිකාවන් (Mintzberg ට අනුව)

- අන්තර් පුද්ගල භූමිකා
- තොරතුරුමය භූමිකා
- තීරණාත්මක භූමිකා

අන්තර් පුද්ගල කාර්යයන් (Interpersonal Roles)

- **නාම මාත්‍ර විධායක (Figurehead):** ආයතනයේ සමාජීය සහ නෛතික කටයුතු වලදී පෙනී සිටීම සහ අනෙකුත් අයව පෙළඹවීමේ හැකියාව තිබීම.
- **නායකයා (Leader):** පුද්ගල කණ්ඩායම් වලට හෝ මුළු සංවිධානයටම නායකත්වය සැපයීම.
- **සහයෝගීතාව ගොඩනගන්නා (Liaison):** අභ්‍යන්තර හා බාහිර පාර්ශවයන් සමඟ සඵලදායී සන්නිවේදන ජාල ගොඩනගා ගැනීම.

තොරතුරුමය කාර්යයන් (Informational Roles)

- **නියමුවා (Monitor):** ව්‍යාපාරික පරිසරයේ සහ කර්මාන්තයේ සිදුවන වෙනස්වීම් පිළිබඳ තොරතුරු නිරන්තරයෙන් සොයා බැලීම.
- **තොරතුරු බෙදාහරින්නා (Disseminator):** තම සහයකයින් සහ කණ්ඩායම් සමඟ අත්‍යාවශ්‍ය තොරතුරු සන්නිවේදනය කිරීම.
- **ප්‍රකාශකයා (Spokesperson):** සංවිධානය වෙනුවෙන් බාහිර පාර්ශවයන්ට (උදා: මාධ්‍ය සාකච්ඡා) තොරතුරු ලබා දීම.

තීරණ ගැනීම හා සම්බන්ධ කාර්යයන් (Decisional Roles)

- වයවසායකයා **(Entrepreneur):** නව අදහස් උත්පාදනය, ගැටළු නිරාකරණය සහ නව අවස්ථාවන් සඳහා සම්පත් ආයෝජනය කිරීම.
- ආරවුල් සමනය කරන්නා **(Disturbance Handler):** අනපේක්ෂිත ගැටළු සහ ව්‍යාකූල තත්වයන් විසඳීමට ඉදිරිපත් වීම.
- සම්පත් බෙදාහරින්නා **(Resource Allocator):** අයවැය ලේඛන සකස් කිරීම සහ මානව හා අනෙකුත් සම්පත් නිසි පරිදි බෙදා හැරීම.
- කථිකා කරන්නා **(Negotiator):** සංවිධානය තුළ ඇති වන වැදගත් සාකච්ඡා සඳහා සෘජුව සහභාගී වීම.

කළමනාකරණ කුසලතා (Management Skills)

- **සංකල්පනාත්මක කුසලතා (Conceptual Skills):** ආයතනයේ සියලු කටයුතු සමස්තයක් ලෙස දැකීමේ සහ සම්බන්ධීකරණය කිරීමේ හැකියාවයි. මෙය ඉහළ මට්ටමේ කළමනාකරුවන්ට වැඩිපුර අවශ්‍ය වේ.
- **මානව කුසලතා (Interpersonal Skills):** පුද්ගලයින් සහ කණ්ඩායම් අවබෝධ කර ගැනීම, අභිප්‍රේරණය සහ සන්නිවේදනය කිරීමේ හැකියාවයි. මෙය සෑම කළමනාකරණ මට්ටමකටම පොදුවේ වැදගත් වේ.
- **තාක්ෂණික කුසලතා (Technical Skills):** විශේෂිත කාර්යයක් ඉටු කිරීමට අවශ්‍ය දැනුම සහ හැකියාවයි (උදා: යන්ත්‍ර, තොරතුරු තාක්ෂණය). මෙය පහළ මට්ටමේ කළමනාකරුවන්ට වැඩිපුර අවශ්‍ය වේ.



PassWay.lk

Thank you!

PassWay.lk

aat SRI LANKA